*ඔසු වවමු - ඉසුරු ලබමු*

# සැවැන්දරා




- උද්භිද නාමය :- *Vertiveria zizanioides*
- ශාක කුලය :- Poaceae
- පොදු සිංහල නම :- සැවැන්දරා
- සංස්කෘත නම :- උශිර / නලද
- දෙමළ නම :- වෙට්ටිවර්
- ඉංග්‍රීසි නම :- Perennial Grass
- රෝපණ ද්‍රව්‍ය :- ගලවා ගත් තෘණ ශාක
- ඖෂධ සඳහා ගන්නා ව්‍යවහාර අංග :- මුල්

## හැඳින්වීම

ආසියානු රටවල් වල දැකිය හැකි තෘණ ශාක විශේෂයකි . උෂ්ණ පරිසර වල හොඳින් වැඩෙන නමුත් තෙත් පරිසරයේ ද වගා කල හැකිය. සුගන්ධවත් මුල් වල ඇති තෛල පදාර්ථ සුවඳ විලවුන් ,සගන්ධ තෙල් නිෂ්පාදනයට බහුලව යොදා ගනී. වියලා ගත් මුල් ඉන්දියාව වැනි රටවල වටාපත් විවීම වැනි වෙනත් කාර්යයන් සදහාද භාවිතා කරයි.

## උද්භිද විද්‍යාත්මක විස්තරය

ඒක බීජ පත්‍රී ශාකයක් වන මෙය මානා වර්ගයට අයත් වන තෘණ පැළෑටියකි . හොදින් වර්ධනය වූ ශාක වල ඉහලට පුෂ්ප මංජරිය හට ගන්නා අතර බීජ සුළග මගින් ව්‍යාප්ත වේ.ගැඹුරු මූල පද්ධතියක් ඇති නිසා පාංශු ඛාදනය වැළැක්වීමට බහුලව භාවිතා කරයි .උණුසුම් හා වියළි පරිසරවල හොඳින් වවර්ධනය වේ. සිහින් දිගටි පත්‍ර අඩි 1- 1.5 පමණ දිගු වේ. පදුරු ආකාරයට වර්ධනය වේ. කදුකර බෑවුම් ප්‍රදේශ වල පාංශු ඛාදනය වැලක්වීමට බහුලව වගා කරයි.

## කෘෂි විද්‍යාත්මක විස්තරය

ලංකාව තුළ වාණිජ වගාවක් වශයෙන් එතරම් ප්‍රචලිතව නැත . නමුත් ගෙවතු ආශ්‍රිත ඉවුරු, කන්ඩි , උස් කඳුකර බෑවුම් වල වගා කර ඇත. ඉහල වාණිජ ඉල්ලුමක් පවතී. සුගන්ධවත් මුල් අස්වැන්න වශයෙන් ලබා ගනී. වියලි පරිසර වල හොදින් වගා කල හැක. නිරෝගී පදුරු වලින් ගලවාගත් ශාක වල පත්‍ර අඩි 1/2 පමන සිටින සේ කපා අඩි 1×1×1 වලවල් වල  කාබනික පොහොර සමග වගා කල හැක. ශාක අතර අඩි 1/2 ක පමණ පරතරය ප්‍රමාණවත් වේ.

## අස්වනු නෙළීම හා ගබඩා කිරීම

සිටුවීමෙන් පසුව අවුරුදු 1 -2 අතර කාල සීමාවකදී අස්වැන්න ලබා ගත හැක. හොදින් පදුරු දමා වර්ධනය වූ තරමට ලබා ගත හැකි අස්වැන්න වැඩි වේ. උදුරාගත් ශාකයේ මුල් කදට අගල් එකක් පමණ සිටින් සේ කපා හොදින් සොදා වියලා ගත යුතුය . තෛල පදාර්ථ හානි නොවන සේ කෙටි කාලයකින් වියලා ගත යුතුය . ගෝනි හෝ බදුන් තුල ගබාඩා කර තබා ගත හැක.

## වර්තමාන භාවිතය හා වෙළඳපොල තත්ත්වය

සුවද විලවුන් නිෂ්පාදනයට හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට ඉහල ඉල්ලුමක් සහිත ශාකයකි. නමුත් මහා පරිමාණ වගාවන් ලංකාව තුල දක්නට නැත. කිලෝවක් සදහා රු. 800/= පමණ වෙළඳපොල මිලක් පවතී.